සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2020 (II)**

| | | |
|---|---|---|
| කාලය: පැය 03 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) - (14) | විභාග අංකය Index No / சுட்டெண் ………………………… |

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. අ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමාජ සුබ සාධන වැඩසටහනක් උදාහරණ ලෙස ගෙන, එම වැඩසටහන දරිද්‍රතාවය සහ සමාජ අසමතුලිත බව අඩු කිරීමට ප්‍රයෝජනවත් වී ඇත්තේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. මෙවන් සුබසාධන වැඩසටහන්වල තිරසාරත්වය වැඩි කර ගැනීමට සහ ඒවායින් ආර්ථිකයට ඇති මූල්‍යමය බර අවම කර ගැනීමට ගත හැකි පියවරයන් විස්තර කරන්න. (ලකුණු 10)

02. අ. රජයේ බදු ආදායම වැඩි කර ගැනීමට ශ්‍රී ලංකාවේ මෑත කාලීනව සිදු කරන ලද බදු ක්‍රමවේද වෙනස්කම් දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ ආදායම් අසමතුලිතතාවය සහ සමාජ අසමතුලිතතාවය අවම කිරීමට සිදු කළ හැකි සාධනීය බදු ප්‍රතිසංස්කරණ ක්‍රම පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10)

03. අ. සේවා වියුක්තිය (Unemployment) සහ ඌණ සේවා නියුක්තිය (Underemployment) යන්න උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සඳහා කාන්තා දායකත්වය වැඩි කර ගැනීමට සිදු කළ හැකි පියවර දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 10)

04. අ. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන විෂය මාලාව හා කාල සීමා පිළිබඳව මෑත කාලීනව යෝජනා වී ඇති සංශෝධන දෙකක් (02) දක්වා ඒවායේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. දැනුම් පදනම් වූ ආර්ථිකයකට පරිවර්තනය වීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු කළ හැකි ප්‍රතිසංස්කරණ දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 10)

05. අ. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ඉහළ අගයක පැවතීමට මූලික වී ඇති හේතු දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට අත්‍යාවශ්‍ය වන නිරෝගිමත් ප්‍රජාවක් බිහි කර ගැනීමට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දායකත්වය ලබා දිය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

06. අ. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය ලැබෙන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය තිරසාර කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි සාධනීය ප්‍රතිපත්ති විස්තර කරන්න. (ලකුණු 10)

*********************